කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

බාහිර විභාග අංශය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ද්විතීය පරීක්ෂණය (බාහිර) - 2009

(2010 මැයි / ජූනි)

සමාජීය විද්‍යා පීඨය

පුස්තකාල හා විඥාපන විද්‍යාව

ග්‍රන්ථ විද්‍යාත්මක පාලනය , වර්ගීකරණය න්‍යාය හා පරිචය - LISC - E2025

**ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න**

ප්‍රශ්න සංඛ්‍යාව : 07 යි                                                    කාලය : පැය 03 යි

---

01. (I) පොදු වර්ග පංතියක් යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද?

(ලකුණු 05)

(II) ඩිවි දශම වර්ගීකරණයේ පොදු වර්ග පංතියේ

A. සංයුතිය
B. ප්‍රබලතා
C. දුර්වලතා
D. විශේෂ ලක්ෂණ පිළිබඳ විග්‍රහයක් ඉදිරිපත් කරන්න.

(ලකුණු 15)

02. (I) දැනුම වර්ගීකරණය සහ පුස්තකාල වර්ගීකරණය කෙටියෙන් පහදන්න.

(ලකුණු 05)

(II) දැනුම වර්ගීකරණය සහ පුස්තකාල වර්ගීකරණය අතර වෙනස්කම් මොනවාදැයි විස්තර කරන්න.

(ලකුණු 15)

03. ''විවිධ ක්‍රම භාවිතය තුළින් මුඛාශ්‍රිත ලක්ෂණ පවත්වාගෙන යන බව ඩිවි දශම වර්ගීකරණයේ මෑත කාලීන සංස්කරණවලින් පෙනී යයි ? ''
මෙම කියමන නිදසුන් දෙමින් පැහැදිලි කරන්න.

(ලකුණු 20)

04. (I) මුඛාශ්‍රිත වර්ගීකරණයක් යනු කුමක්ද?

(ලකුණු 05)

(II) විශ්ව දශම වර්ගීකරණය මුඛාශ්‍රිත වර්ගීකරණයක් ලෙස ඔබ පිළිගන්නේ ද? මේ සඳහා නිදසුන් දෙමින් පක්ෂව හෝ විපක්ෂව කරුණු දක්වන්න.

(ලකුණු 15)

05. ''දෙතිත් වර්ගීකරණය අනෙකුත් සියළුම වර්ගීකරණ අතුරින් වෙනස් මාර්ගයක ගිය වර්ගීකරණ ක්‍රමයකි. තව ද එම වර්ගීකරණයටම ආවේණික වූ සුවිශේෂ ලක්ෂණ වලින් අනූන ක්‍රමයක් ලෙස ද හැඳින්විය හැකිය. ''
මෙම කියමන නිදසුන් දෙමින් පැහැදිලි කරන්න.

(ලකුණු 20)

06. (I) විෂය මුඛයක් යනු කුමක්ද?

(ලකුණු 05)

(II) ''විෂය මුඛ විශ්ලේෂණය'' උදාහරණ දෙමින් පැහැදිලි කරන්න.

(ලකුණු 09)

(III) පුස්තකාල වර්ගීකරණයෙහි ලා විෂය මුඛ විශ්ලේෂණය ප්‍රයෝජනවත් වන අයුරු කෙටියෙන් දක්වන්න.

(ලකුණු 06)

07. පහත මාතෘකා අතුරින් **<u>හතරක් (04)</u>** පිළිබඳ ප්‍රමාණවත් සටහන් ලියන්න.

(I) සහායක අනුපිළිවෙල
(II) උපලේඛන
(III) ඩිවි වර්ගීකරණයේ සාරාංශ
(IV) ප්‍රධාන වර්ග පංති
(V) අංකනය
(VI) චක්‍ර නොහොත් වගු

******************************